දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2876169, 011-2876181
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E-mail: info@psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
No. 1200/9, Rajamalwatta Road, Battaramulla

මගේ අංකය / எனது இல. / My No.: PSC/APP/07/1391/2019
ඔබේ අංකය / உமது இல. / Your No.: MF1/02/20/EXC/08-5
දිනය / திகதி / Date: 2020 සැප්තැම්බර් මස 28 දින

ලේකම්,
මුදල් අමාත්‍යාංශය

<u>සහකාර සුරාබදු කොමසාරිස් තනතුරට උසස් කිරීම</u>

උක්ත කරුණ සම්බන්ධ ඔබේ සමාංක හා 2020.07.14 දිනැති ලිපිය හා බැඳේ.

02. එම ලිපියේ සඳහන් කරුණු සම්බන්ධයෙන් සලකා බැලූ රාජ්‍ය සේවා කොමිෂන් සභාව, ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සහකාර සුරාබදු කොමසාරිස් තනතුරු පුරප්පාඩු පිරවීමට අදාළව පහත සඳහන් තීරණ ලබා දී ඇති බව එහි නියමය පරිදි කාරුණිකව දන්වමි.

I. ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සහකාර සුරාබදු කොමසාරිස් තනතුරු පුරප්පාඩු 03 ක් පිරවීම අනුමත කිරීමට

II. ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියේ 10.1.1.2 වගන්තිය යටතේ සඳහන් ලකුණු පරිපාටියේ පළමු නිර්ණායකයේ මාතෘකාව "ජ්‍යෙෂ්ඨතාවය"යන්න "සේවා පලපුරුද්ද" ලෙස සංශෝධනය කිරීම අනුමත කිරීමට

III. ඉහත අනු අංක II හි සඳහන් පරිදි අදාළ බඳවා ගැනීමේ පරිපාටිය සංශෝධනය කිරීමට හා එම සංශෝධිත බඳවා ගැනීමේ පරිපාටිය ප්‍රසිද්ධියට පත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ඔබට දැන්වීමට

IV. ඔබ විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පත් කැඳවීමේ නිවේදනය හා ලකුණු පරිපාටිය පහත සඳහන් සංශෝධනයන් සිදු කිරීමට යටත්ව අනුමත කිරීමට

- අයදුම්පත් කැඳවීමේ නිවේදනය
    a. පළමුවන ඡේදය "සුරාබදු දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු වී පවතින සහකාර සුරාබදු කොමසාරිස් තනතුරු පුරප්පාඩු තුනක්(03) සඳහා සුදුසුකම්ලත් සුරාබදු අධිකාරීවරුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ" ලෙස සංශෝධනය කිරීම
    b. අමාත්‍යාංශ නාමය මුදල් අමාත්‍යාංශය ලෙස සංශෝධනය කිරීම

- ලකුණු පරිපාටිය
    a. පළමු තීරයේ මාතෘකාව "ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සහකාර සුරාබදු කොමසාරිස් තනතුරට උසස් කිරීම සඳහා ලකුණු ලබා දෙන නිර්ණායක" ලෙස සංශෝධනය කිරීම
    b. පස්වන ඡේදය "මෙම දෙපාර්තමේන්තුවට අදාළ රාජකාරී සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ අදාළ අමාත්‍යාංශ ලේකම් වෙතින් පොදු 230b ආකෘතිය අනුව ලබා ගත් එක් ප්‍රශංසාවකට ලකුණු 02 බැගින්" ලෙස සංශෝධනය කිරීම

V. ඔබ විසින් ඉදිරිපත් කර ඇති ආදර්ශ අයදුම් පත්‍රය අනුමත කිරීමට

VI. ඔබ විසින් ඉදිරිපත් කර ඇති පහත සඳහන් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය අනුමත කිරීමට

- එච්. හේමාල් කස්තුරිආරච්චි මහතා - සභාපති
  අධ්‍යක්ෂ ජනරාල්,මුදල් අමාත්‍යාංශය
- ඒ. බෝදරගම මහතා - සාමාජික
  සුරාබදු කොමසාරිස් ජනරාල්(වැ.බ.), සුරාබදු දෙපාර්තමේන්තුව
- අයි.ඩබ්.එම්.සී.කේ. ඉලංගකෝන් මහතා - සාමාජික
  ආයතන අධ්‍යක්ෂ, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
- සජීව චන්දන මැදවත්ත මහතා - සාමාජික
  නියෝජ්‍ය පොලිස්පති, පොලිස් දෙපාර්තමේන්තුව
- එම්.ජී.එස්.ඒ. විමලසේන මහත්මිය - සාමාජික
  නියෝජ්‍ය රස පරීක්ෂක, ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව

අත්සන / එච්.ඒ.ඩී.සී. ජයසේකර
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (උසස් කිරීම්)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට

පිටපත: සුරාබදු කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව - කාරු. අ.ක.ස.

**ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවෙහි විධායක සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය**

**සංශෝධන අංක 03**

| | ඡේද අංකය | ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ පවතින ආකාරය | ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ සංශෝධනය විය යුතු ආකාරය |
|---|---|---|---|
| 1 | 10.1.1.2 වගන්තියෙහි සඳහන් ලකුණු පටිපාටිය | 1. ජ්‍යෙෂ්ඨතාවය සඳහා (සුරාබදු අධිකාරි තනතුරෙහි වසර 05 ක සේවා කාලයෙන් පසු සෑම වසරකටම ලකුණු 05 බැගින්) උපරිම ලකුණු | 1. සේවා පලපුරුද්ද සඳහා (සුරාබදු අධිකාරි තනතුරෙහි වසර 05 ක සේවා කාලයෙන් පසු සෑම වසරකටම ලකුණු 05 බැගින්) උපරිම ලකුණු |